# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2133/3- 2019 ජූලි මස 22 වැනි සඳුදා - 2019.07.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ප්‍රා. ලේ. යොමු අංකය* : හඟු/3/2/1/108.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය* : 4 - 3/9/2013/WS/479.

නුවරඑළිය දිස්ත්‍රික් සමූහ ජලසම්පාදන ව්‍යාපෘතියේ රිකිල්ලගස්කඩ ජලසම්පාදන ව්‍යාපෘතියේ රිකිල්ලගස්කඩ ජලසම්පාදන ක්‍රමයේ පීඩන සිඳින ටැංකි අංක 1A ඉදිකිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින්,1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ ( සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

**ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර -**

01. **කැබලි අංකය** - සර්වේ ජනරාල්ගේ පිඹුරු අංක නු 3291හි කැබලි අංක 01.

ඉඩමේ නම: රහතුන්ගොඩ වත්ත (රට්ලන්ඩ් කොටස); විස්තරය: විවෘත මුඩු බිම, පීඩන සිඳින ටැංකියක් ඇත; හිමිකම් කියන අය: ජනතා වතු සංවර්ධන මණ්ඩලය, අංක 55/75, වොක්ෂෝල් පටුමහ, කොළඹ 02; ප්‍රමාණය: හෙක්. 0.0173.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්/අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය පවරන ලද අයවලුන් හෝ 2019.08.21 දින පස්වරු 1.00 ට හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2019.08.14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය. හිමිකම් කීම පිළිබඳව ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

අයි.එම්.සේනානායක,
ප්‍රාදේශීය ලේකම්,
හඟුරන්කෙත.

2019 ජූලි මස 15 වැනි දින,
හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

08 - 202

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: EMDS/LND/05/ACQ/02/09.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/15/2013/VE/619.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආදොළුව වසමේ ගම් පුළුල් කිරීම යටතේ ඉඩම් අත්පත් කර ගැනීමට අදාළව 7 වන වගන්තිය යටතේ දැන්වීම, අංක 2107/46 හා 2019.01.25 දිනැති *ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධියට පත් කරන ලදි. එහි පිඹුරු අංකය R/EMB/2018/181 ලෙස සඳහන්ව ඇත්තේ අතපසු වීමකිනි. එය සර්වේයර් ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද මූලික පිඹුරේ අ. ග. පි 882 අතිරේක අංක 28 පත්‍ර අංක 28 ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දී සිටිමි.

ප්‍රසංග උදයකාන්ත,
ප්‍රාදේශීය ලේකම්/ අත්කර ගැනීමේ නිලධාරී,
ඇඹිලිපිටිය.

2019 ජූලි මස 15 වැනි දින
ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

08 - 203

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ ගොනු අංකය* : 4 - 3/7/2016/HW/129.
*මගේ අංකය*: 3/6/2016/10-80.

මා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1996/3 හා 2016 දෙසැම්බර් 05 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 7 වන වගන්තිය යටතේ දැන්වීමෙහි අනු අංක 74 යටතේ සඳහන් කර ඇති අංක 80 දරන බිම් කැබැල්ල සඳහන් ඡේදය මෙයින් අවලංගු කරනු ලැබේ.

ඒ වෙනුවට මූලික පිඹුරු අංක 2421 හි කැබලි අංක 02 දරන ඉඩම් කැබැල්ල මෙයින් ආදේශ කරනු ලබන බව මහජනතාවගේ දැනගැනීම සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. **කැබලි අංක 2**
හිමිකම් කියන්නා: රජය; ප්‍රමාණය: හෙක්. 0.3831.

ඉහත සඳහන් ඉඩමට පරවශ්‍යතාවට හිමිකම්/අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.09.12 දින පෙ. ව. 10.00 ට පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2019.08.31 දිනට මත්තෙන් එම ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් ඒකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩී. අනෝමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
පොල්ගහවෙල.

2019 ජූලි මස 10 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

08 - 221

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.